සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

# නාට්‍ය හා රංගකලාව - I

කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - තෙමාලා රෙද්ද හැලියේ ඔබන කොට
රවාලා පැනපි මහ ඉතිකුණ ගෙට
අසාලා පැනපි කොල්ලෝ දොර පිළට
කපාලා දෙමුව කොටඹේ වීරයට

B - උන්දලාට කඹුරන්නට මම යැද ඉන්නේ
සුරන්හට දෙස් කොටා
වකුටු කුදේ නොණ්ඩි පය තියා එති කෙතට
බැඳපු ලෙස එපඹයා

C - පැනයක් ඇත අපට - පැනයකි එය ඔබටත්
අප ඔබට පැනයක් - බව අපි දනිමු උදක්
ඊට ඔබ දෙන විසඳුම - වී ඇත අපට පැනයක්

D - ගදහයා - මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානෙට වැඩියේ ඇයි ?
භික්ෂුව - මේ එන්නම උවමනාවක් නිසා තමයි මම ආවේ. ඔබ ඉඩ දෙනවානම් මම කැමතියි. මෙහෙ නවාතැන් ගන්න අද රාත්‍රියට

01. කොහොඹා කංකාරි ශාන්ති කර්මයට අයත් පද්‍යයකි

(1) A (2) B (3) C (4) D

02. පහතරට ගැමි නාටකයට අයත් පද්‍ය ඛණ්ඩයකි,

(1) A (2) B (3) C (4) D

03. සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍යයකට අයත් ගීත ඛණ්ඩයකි.

(1) A (2) B (3) C (4) D

04. බෞද්ධ පූජා කර්මයකට අයත් දෙබස් ඛණ්ඩයකි,

(1) A (2) B (3) C (4) D

05. C අකුරෙන් දැක්වෙන දෙබස් ඛණ්ඩය අයත් නාට්‍ය වන්නේ,

(1) දික්තල කාලගෝල (2) නෙළුම් කුමාරි (3) විකෘති (4) සුහ සහ යසස



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
    (1) සංගීතය, මූර්ති ශිල්පය, මුද්‍රා නාට්‍ය, නාට්‍ය, ගීත නාට්‍ය
    (2) නර්තනය, සංගීතය, ඔපෙරා, නාට්‍ය මුද්‍රා නාට්‍ය
    (3) චිත්‍ර කලාව, මුද්‍රා නාට්‍ය, සංගීතය, නර්තනය, ගීත නාට්‍ය
    (4) නර්තනය, සාහිත්‍ය, චිත්‍ර කලාව, මූර්ති ශිල්පය, ඔපෙරා
07. නෘත්ත කාණ්ඩයට අයත් වන්නේ,
    (1) ඔපෙරා, මුද්‍රා නාට්‍ය, සංගීත ප්‍රසංගය
    (2) මනිපුරි, කථක්, කථකලි
    (3) භරත නාට්‍යයම්, රාධා ක්‍රිෂ්ණා නර්තනය, ශිව පාර්වති නාට්‍ය
    (4) ශුද්ධ මාත්‍රා නැටුම, ලී කෙළි නැටුම, කෝලම් නැටුම
08. සැප හා දුක මුසු වූ ලෝකයාගේ ස්වභාවය ආංගිකාදී අභිනයන් මඟින් දක්වෙන කල එය ''නාට්‍යයැයි'' පවසනු ලැබේ. මෙය ඇතුලත් වන්නේ,
    (1) කාව්‍ය ශාස්ත්‍රයෙහිය. (2) නාට්‍ය ශාස්ත්‍රයෙහිය.
    (3) දශරූපනයෙහිය. (4) අභිනය දර්පණයෙහිය.
09. නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීම,
    (1) නිෂ්පාදකගේ කාර්යභාරයයි. (2) වේදිකා පාලකගේ කාර්යභාරයයි.
    (3) අධ්‍යක්ෂකගේ කාර්යභාරයයි. (4) අනුශාංගික ශිල්පීන්ගේ කාර්යභාරයයි.
10. සංගීතය අවම වශයෙන් භාවිතා කරන නාට්‍යයන් වන්නේ,
    (1) ලෝක ධර්මී නාට්‍යවලදී ය. (2) ළමා නාට්‍ය හා යොවුන් නාට්‍ය වලදීය.
    (3) මුද්‍රා නාට්‍ය හා ඔපෙරා වලදීය. (4) නාට්‍ය ධර්මී නාට්‍ය වලදීය.
11. නළු කාර්යයේ සාර්ථකත්වය වේදිකාවේ දී හොඳින් සිදු වූවා යැයි නළුවාට සතුටට පත්විය හැක්කේ,
    (1) නළුවාගේ පෞරුෂත්වය මතය.
    (2) ප්‍රේක්ෂක ප්‍රතිචාරයේ ධනාත්මකභාවය මතය.
    (3) අධ්‍යක්ෂවරයා ඉන් සෑහීමට පත් වූ විටය.
    (4) රූපන ශිල්පියාට තම රූපණය පිළිබඳව වැටහීයාමෙනි.
12. අංග රචනයේ මූලික අරමුණකි.
    (1) අඳුරු කළ වේදිකාවේ සිටින චරිත ප්‍රබල ලෙස ඉස්මතු වීමටය.
    (2) රූපණ ශිල්පියාගේ අලංකාර බව ඉස්මතු කිරීමට.
    (3) ආලෝක ශිල්පියාගේ රංගාලෝකයට දායක වීමටය.
    (4) දුර සිටින ප්‍රේක්ෂකයාට වෙහෙසට පත් නොවී නැරඹීමට හැකිවීමටය.
13. පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු වන්නේ,
    (1) වේදිකා අලංකරණය කිරීමක් ලෙස යොදා ගැනීමට
    (2) නළු කාර්ය පහසු කිරීමට.
    (3) පසුතලය මගින් ප්‍රේක්ෂ ආකර්ශණය දිනාගැනීමට.
    (4) අධික වියදමක් දරා කාලයක් තිබීමට නිර්මාණය කිරීමට.
14. වේෂභූෂණ ශිල්පියාගේ වගකීමක් වන්නේ,
    (1) වේදිකා මායාව ප්‍රබල කිරීමට දායකවීම.
    (2) අඩු වියදමකින් සාදා අධ්‍යක්ෂවරයාට ලබා දීම.
    (3) රංග රචනය ප්‍රබල කිරීමට දායක වීම.
    (4) චිත්තාකර්ෂණීය ලෙස ප්‍රේක්ෂකයා බැඳ ගැනීමට දායක වීම.
15. වේදිකාවේ රංගනයක් සිදුවන විට එම අස්ථාවේ සියලු දෙනාම පෙනෙන ආකාරයට වේදිකාවට ආලෝකය සපයනු ලබන්නේ,
    (1) ස්පොට් පහන ය. (2) ෆ්ලඩ් පහන ය. (3) ස්ට්‍රිප් පහනය. (4) වර්ණ චක්‍රය
16. නාට්‍යයක ආනුශාංගික කලා යොදා ගැනීමෙන් අපේක්ෂා කරන්නේ,
    (1) නළු නිලියන්ගේ රංග කාර්ය පහසු කිරීමය.
    (2) වේදිකා මායාව ප්‍රකට කිරීමය.
    (3) රංග භූමිය විචිත්‍ර කිරීමය.
    (4) නාට්‍යයක අත්‍යවශයෙන් තිබිය යුතු කලාංග වීමය.

- **පහත දැක්වෙන වගුව ඇසුරෙන් 17 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය / අනුවර්තය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| මර්චන් ඔෆ් වෙනිස් | ක | වැනිසියේ වෙළෙන්දා | බන්දුල විතානගේ |
| ග | හෙන්රි ඉබ්සන් | බෝනික්කි ගෙදර | සුනිල් විජේසිරිවර්ධන |
| ද ප්‍රොපෝසල් | ඇන්ටන් චෙකොෆ් | ජ | යූ. ඒ. ගුණසේකර |
| ඉක්නෙව්ටාඉ | සොෆොන් ලීස් | බෙරහඬ | ට |
| ද එල්බර් සන් | ඇලෙක්සැන්ඩර් වම්පිලෝව් | ඩ | ප්‍රසන්න විතානගේ |

17. ඉහත වගුවේ ''ක'' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක් ද?
    (1) විලියම් ශේක්ෂ්පියර් (2) මැක්සිම් ගෝර්කි (3) හෙන්රික් ඉබ්සන් (4) බර්නාඩ් ෂෝ
18. ඉහත වගුවේ ''ග' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය කුමන් ද?
    (1) ද එල්ඩර් සන් (2) ඩෝල්ස් හවුස් (3) රූඩන්ඩ් (4) චෙරි ඔර්චාර්ඩ්
19. ඉහත වගුවේ ''ජ'' කොටුවට ඇතුලත්විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
    (1) හරිම බඩු හයක් (2) කපුවා කපෝති (3) මඟුල් ප්‍රස්තාව (4) අහස් මාලිගා
20. ඉහත වගුවේ ''ට'' කොටුවට අයත් මෙරට අධ්‍යක්‍ෂ / නිෂ්පාදකගේ නම කුමක් ද?
    (1) බන්ධුල විතානගේ (2) හෙන්රි ජයසේන (3) ධම්ම ජාගොඩ (4) බන්දුල ජයවර්ධන
21. ඉහත වගුවේ ''ඩ'' කොටුවට අයත් පරිවර්තිත නම කුමක් ද?
    (1) සකල ජන (2) රෝමය ගිනිගනී.
    (3) පුත්‍ර සමාගම (4) හෙලේ නැග්ග ඩෝං පුතා
22. ලෝක ධර්මී නාට්‍යයක ලක්‍ෂණයක් සේ සැලකෙන්නේ,
    (1) යථාර්ථය ඒ වූ ලෙසටම වේදිකාවේ රඟ දැක්වීම.
    (2) නාට්‍ය ගීත මගින් හා වේදිකා ආලෝකය අතිශයෝක්තියෙන් තිබීම.
    (3) ස්වභාවිකත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාවේ ඉදිරිපත් කිරීම.
    (4) අතිශයෝක්තියට නගා රූපණය ඉදිරිපත් කිරීම.
23. නාට්‍යයක තිබිය යුතුම ලක්‍ෂණයකි,
    (1) චරිත (2) සංවාද (3) සජිවී බව (4) ගීත
24. නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී,
    (1) ගැටුම් අවස්ථාව නාට්‍ය පෙළ අවසානයේ දී නිරාකරණය කළ යුතුය.
    (2) මුල, මැද, අග සහිතව පිළිවෙලින් රචනා කර තිබිය යුතුය.
    (3) නාට්‍ය ගීත මගින් නාට්‍ය පෙළ අවස්ථා ප්‍රබෝධමත් කිරීම සිදු විය යුතුය.
    (4) චරිත, රංගවිධාන හා සංවාද නිරවුල්ව තිබිය යුතු ලියවිල්ලකි.
25. කරලිය රංග භූමිය ලෙස භාවිතා කරමින් සිදුකරනු ලැබූ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,
    (1) නාඩගම් නාට්‍යයි. (2) නූර්ති නාට්‍යයි. (3) කෝලම් නාට්‍යයි. (4) ලෝක ධර්මි නාට්‍යයි.

- **පහත දැක්වෙන රූප අශ්‍රයෙන් 26 - 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 

B 

26. සමාරෝපනය අවස්ථා කිහිපයක් තුල දී සිදුකරන භූමිකා රංගනයක් දැකිය හැකි ශාන්ති කර්මයක අන්තර්ගත චරිතයක් වන්නේ,
    (1) 18 සන්නියේ සූනියම් යක්‍ෂනිය. (2) සූනියම් යාගයේ සූනියම් අවතාරය.
    (3) රටයකුමේ රිද්දි බිසව. (4) කෝලම් නාටකයේ නොංචි අත්තා.
27. මැණික්පාල ශාන්තියට අයත් නාට්‍යමය පෙළපාලියක් අන්තර්ගත රූපය වන්නේ,
    (1) සූනියම් යාගයේ මැණික්පාල ශාන්තිය (2) සන්නියකුමේ සූනියම් යක්‍ෂනියගේ අවතාරය
    (3) B රූපයේ දැක්වෙන වඩිග පටුන (4) A රූපයේ දැක්වෙන සූනියම් අවතාරය

28. නාට්‍ය රචකයකු, අධ්‍යක්ෂවරයෙකු, නිෂ්පාදකවරයෙකු, මෙනම් රංගන ශිල්පියෙකු වූ ජයලත් මනෝරත්න නාට්‍යවේදියා අප අතරින් සමුගත්තේ,
(1) 2019 දෙසැම්බර් පළමු වැනිදාය. (2) 2020 ජනවාරි දොළොස් වෙනිදාය.
(3) 2020 පෙබරවාරා දොළොස් වෙනිදාය. (4) 2019 දෙසැම්බර් තිස් එක්වෙනිදාය.

29. 1956 න් පසු දෙමළ නාට්‍ය කලාව නව මාවතක් ඔස්සේ ප්‍රවර්ධනය කිරීමට දායක වූ ද්‍රවිඩ නාට්‍ය ශිල්පියා වන්නේ,
(1) එස්. විද්‍යානන්දන් ය. (2) ගෝවින්ද සාමී රාඕ ය.
(3) එස්. කේ. සෙල්ලයියා පිල්ලේ ය. (4) එම්. වී. ක්‍රිෂ්ණා අල්වාර් ය.

30. මෙරට ඉංග්‍රීසි නාට්‍ය කලාවේ පුරෝගාමියා ලෙස හැඳින්වෙන්නේ,
(1) ගාර්ෂියා ලෝර්කා ය. (2) ඊ. එෆ්. ඩී. ලුඩෝවයික් ය.
(3) කේ. කනපති පිල්ලේ ය. (4) ක්වින්ටරෝ සහෝදරයෝ ය.

- **31 සිට 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත දැක්වෙන රූප ඇසුරු කරගන්න.**




31. ලූෂන් බුලත්සිංහල මහතාගේ ''තාරාවෝ ඉගිලෙති'' නාට්‍යයට රංගනයෙන් දායක වූයේ,
(1) A ය. (2) C ය. (3) B ය. (4) D ය.

32. නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය, තනු නිර්මාතෘ, රංගනය ආදී වූ දක්ෂතා මෙන් ම නාඩගම් සම්ප්‍රදාය ඇසුරු කරගත් නාට්‍ය ශිල්පියෙකු ද වන්නේ,
(1) B ය. (2) A ය. (3) C ය. (4) D ය.

33. නූතන තරගකාරී අධ්‍යාපන ක්‍රමය හමුවේ බිඳ වැටෙන යෞවනත්වයේ ඛේදජනකය පිළිබඳ ඉදිරිපත් කෙරෙන නාට්‍යයක ප්‍රධාන චරිතයට පණ පොවන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

34. වර්තමානයේ ස්වතන්ත්‍ර නාට්‍ය රචකයකු මෙන්ම ටෙලි නාට්‍ය හා චිත්‍රපට රචකයකු ලෙස ජනප්‍රිය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

35. නූර්ති වලින් පසු බිහි වූ ටීටර් නාට්‍ය කලාවේ පුරෝගාමී නාට්‍යකරුවා වන්නේ,
(1) සිරිසේන විමලවීර. (2) බී. ඒ. ඩබ්ලිව් ජයමාන්න.
(3) සී. දොන් බස්තියන්. (4) වී. ක්‍රිස්ටියන් පෙරේරා.

36. බී. ඒ. ඩබ්ලිව්. ජයමාන්න මහතා පුරෝගාමී වූ නාට්‍ය සම්ප්‍රදාය වනුයේ,
(1) නූර්ති (2) මිනර්වා (3) ටීටර් (4) පාස්කු

37. සීමිත අවකාශයක් තුළ තාත්විකත්වය ඉක්මවා, මිනිස් සිරුර භාවිතය තුළින් විවිධ දේ මවා පෑමට හැකි රංගන කලාව හැඳින්වෙනුයේ,
(1) ලෝකධර්මී නාට්‍ය වශයෙනි. (2) නාට්‍යධර්මී නාට්‍ය වශයෙනි.
(3) අභිරූපණ නාට්‍ය වශයෙනි. (4) බැලේ නාටය වශයෙනි.

38. නළුවෙකුට දීර්ඝ සංවාද ඛණ්ඩයක් නිවැරදිව හා පැහැදිලි උච්චාරණය කිරීමේ හැකියාව වර්ධනය කරගත හැකි අභ්‍යාස ක්‍රමයක් වන්නේ,
(1) ශ්වසන අභ්‍යාස (2) දර්පණ අභ්‍යාස
(3) කටහඬ අභ්‍යාස (4) චිත්ත ඒකාග්‍රතා අභ්‍යාස

39. රූපණ ශිල්පියෙකුගේ භාව ප්‍රකාශනය සඳහා ප්‍රබල ලෙස දෑස් යොදාගත යුතුය. මේ සඳහා සුදුසුම අභ්‍යාස ක්‍රමය වන්නේ,
(1) සංවේදන අභ්‍යාස (2) හිමකන්ද දියවීමේ අභ්‍යාස
(3) දර්පණ අභ්‍යාස (4) චිත්ත ඒකාග්‍රතා අභ්‍යාස

40. ''සවේෂ පුහුණුව'' යනුවෙන් අදහස් කෙරෙනුයේ
(1) සමාරෝප ගැන්වීමෙන් පසු රංගය පුහුණුවීම.
(2) සියලුම නළුවන් පුහුණු කිරීම.
(3) අනුශාංගික අංග පමණක් සැලසුම් කිරීම.
(4) මංගල දර්ශනයට පෙර සියලුම අංග සහිතව සිදුකරනු ලබන පුහුණුව

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ වර්තමාන නිර්මාණකරුවා කවු ද? (ල. 02)

(ii) ඉහත නිර්මාණකරුවාගේ වෙනත් නිර්මාණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) මෙම නාට්‍යයේ ගැටුම් අවස්ථා 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(iv) දික්තල කාලගෝල නාට්‍යයේ නාඩගම් ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(v) දික්තලාගේ චරිත ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(vi) නාට්‍යයේ කාලගෝල ප්‍රශ්නය විසඳන චරිතය නම්කර, එම චරිතයෙහි ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(02) (i) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍ය ශෛලීන් ඉදිරිපත් කළ පඬිවරයා හා එය සඳහන් ග්‍රන්ථය නම් කරන්න. (ල. 03)

(ii) ලෝක ධර්මී ශෛලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(iii) නාට්‍ය ධර්මී නාට්‍යයක් උදාහරණ ලෙස ගෙන එම ශෛලියේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 05)

(03) (i) කෙටි නාට්‍ය නිර්මාණකරුවන් දෙදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ එක බැගින් සඳහන් කරන්න. (ල. 03)

(ii) ''කෙටි නාට්‍ය සංකල්පය'' යන්න නිර්වචනය කරන්න. (ල. 04)

(iii) කෙටි නාට්‍යයක් කෙසේ විය යුතුදැයි පැහැදිලි කරන්න. (ල. 05)

(04) (i) රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 03)

(ii) රංග අභ්‍යාස 02 ක් හා රංග ක්‍රීඩා 02 ක් සඳහන් කරන්න. (ල. 04)

(iii) රූපණ ශිල්පියෙකුට රංග ක්‍රීඩාවලින් ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ල. 05)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(05) (i) නූර්ති නාට්‍යකරුවන් 02කු හා ඔවුන්ගේ නිර්මාණ 02 බැගින් සඳහන් කරන්න. (ල. 03)

(ii) නූර්ති නාට්‍ය කලාව ශ්‍රී ලංකාව තුළ කෙසේ ආරම්භවී ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(iii) නූර්ති නාට්‍යයෙහි රංග ශෛලිය විස්තර කරන්න. (ල. 05)

(06) (i) නෘත, නෘත්‍ය යන්න කෙටියෙන් දක්වන්න. (ල. 03)

(ii) නාට්‍ය කලාවේ සුවිශේෂී ලක්‍ෂණ 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) නාට්‍යය හා කතාන්දරය අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ල. 05)

(07) එක්තරා තාපසයෙකු ගණ වනාන්තරයක තවුස්දම් පුරමින් හුදකලාව කාලය ගත කළහ. දිනක් ජලය ගෙන ඒමට ගඟ දෙසට ගමන් කරමින් සිටින විට කාන්තාවක් විලාප දෙන හඬක් ඇසිනි. ඒවිට තවුසා......

ඉහත කතා සාරය ගෙන නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීමට (ල. 06)

(ii) සංවාද, රංගවිධාන සහිත පිටපතක් නිර්මාණය කිරීම. (ල. 06)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**තෙවන වාර පරීක්ෂණය 2020**

11 ශ්‍රේණිය

**නාට්‍ය හා රංග කලාව**

# ප්‍රායෝගික පරීක්ෂණය

01 කෙටි නාට්‍ය නිෂ්පාදනය (සාමූහික) ළමුන් හුරු වී ආ නාට්‍ය ඉදිරිපත් කිරීම හෝ කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම. (සාමූහික)

02 නිර්මාණාත්මක රංග රචනය (සාමූහික) අ: පො: ස: (සා. පෙළ) ජාතික විභාගය සඳහා ඉදිරිපත් කර ඇති සංගීත හඬපට අතරින් එකක් තෝරාගෙන ඉදිරිපත් කිරීම.

03 පෙළ ආශ්‍රිත භාෂන රංගනය (කේවල)

I ශිෂ්‍යයා විසින් පුහුණු වී පැමිණි දිත්තල කාලගෝල / විකෘති නාට්‍ය කොටසක් ඉදිරිපත් කිරීම.

II පරීක්ෂණ මණ්ඩලය විසින් ලබාදෙන කොටස ඉදිරිපත් කිරීම.

04 නාට්‍ය ගීතය (කේවල) අපේක්ෂකයා හුරු වී ආ නාට්‍ය ගීතය් ඉදිරිපත් කිරීම.

05 ක්ෂණික නිරූපණය (කේවල) ගුරුවරයා අභිමත පරිදි මාතෘකාවක් ලබා දෙන්න.

(ලකුණු 20)

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(3) | 4 -(4) | 5 -(3) | 6 -(2) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(1) |
| 11-(2) | 12 -(4) | 13 -(2) | 14 -(1) | 15 -(2) | 16 -(2) | 17 -(1) | 18 -(2) | 19 -(3) | 20 -(4) |
| 21-(3) | 22 -(3) | 23 -(3) | 24 -(4) | 25 -(1) | 26 -(1) | 27 -(1) | 28 -(2) | 29 -(1) | 30 -(2) |
| 31-(3) | 32 -(2) | 33 -(4) | 34 -(3) | 35 -(1) | 36 -(2) | 37 -(3) | 38 -(1) | 39 -(3) | 40 -(4) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) පුණ්‍යසේන ගුණසිංහ මහතා

(ii) කැකිල්ලේ / බන්ධන / වෙස්සන්තර

(iii) * දික්තල හා කාලගෝලයා අතර ඇතිවන ගැටුම
* කාලගෝලය හා දික්පිටියා අතර ඇතිවන ගැටුම
* නඩු විභාගය අවස්ථාවේ ඇතිවන ගැටුම
* කාලගෝලයාගේ මනස තුළ ඇතිවන ගැටුම (මින් කුමන හෝ පිළිතුරු 2 ක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

(iv) * පොතේ ගුරුගේ චරිතයක් තිබීම.
* පොතේ ගුරුට සහය වන ගායක පිරිසක් සිටීම.
* බහුභූත කෝලම නමින් චරිතයක් තිබීම.
* පූර්ව රාගයක් තිබීම.
* පොතේගුරු පූර්ණ විරිඳුවකින් නාට්‍ය ආරම්භ කිරීම.
* මංගලම් සිංදුවකින් නාට්‍ය අවසන් කිරීම.
* රංග භාණ්ඩ හා පසුතල නිර්මාණ භාවිතා නොකිරීම.
* රිද්මයානුකූල සංවාද භාවිතය
* ගීත බහුලව තිබීම.
* රිද්මයානුකූල චලන භාවිතා කිරිම. (මෙම පිළිතුරුවලින් 2 ක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(v) පිළිතුරු ලියා ඇති ආකාරයට ලකුණු ලබාදෙන්න. (චරිත ලක්ෂණ)

(vi) මහෞෂධ පඬිතුමා - චරිත ලක්ෂණ ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

02 (i) භරතමුණි පඬිවරයා - නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථය

(ii) ලෝකධර්මී නාට්‍ය ශෛලිය හඳුනාගෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
උදා - ලෝකයේ පවතින ස්වාවයට අනුව විර්මාණය වූ නාට්‍ය

(iii) මනමේ නාට්‍ය, සිංහබාහු, දික්තල කාලගෝල, කදාවළලු, නරිබෑනා, කුවේණි යන නාට්‍ය යක ලක්ෂණ පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03 (i) ධනංජන කරුණාරත්න, මංගල සේනානායක, ඇන්ටනි ජයලත්, කපිල කුමාර කාලිංග

(ii) * සෑම අංශයකින්ම සංක්ෂිප්ත වූ නාට්‍යයකි.
* ජීවිතයේ කිසියම් සංසිද්ධියක් පාදක කරගෙන සීමිත චරිත කිහිපයක් මගින් කෙටි කාලයක් තුළ එක් අංකයකදී විකාශනය වන ඒකාංග නාට්‍යයක් ලෙස හැඳින්වේ. (මෙවැනි නිර්වචනයක් ගොඩනගා ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

(iii) * කෙටි කතා පුවතක් / සිද්ධියක් වීම
* චරිත සීමිත වීම
* කාලය සීමිත වීම
* එක් දර්ශනයකින් පෙන්වීම
* පසුතල, රංග භාණ්ඩ සරල විය යුතුය
* භාෂාව ප්‍රබල වීම
* රංගනය, රචනය හා අධ්‍යක්ෂණය ප්‍රබල වීම

(මෙවැනි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

04 (i) <u>රංග අභ්‍යාස යනු</u>
රූපණය සඳහා අවශ්‍ය කායික හා මානසික සමබරතාව ඇතිකර ගැනීම සඳහා රූපණ ශිල්පියෙකු විසින් සිදුකරනු ලබන ප්‍රායෝගික පුහුණුවීම රංග අභ්‍යාසය යනුවෙන් හැඳින්වේ.
<u>රංග ක්‍රීඩා යනු</u>
ආධුනික හෝ ප්‍රවීණ රූපණ ශිල්පියෙකු විසින් කායික හා මානසික සමබරතාව ඇතිකර ගැනීම සඳහා කරනු ලබන ක්‍රීඩා රංග ක්‍රීඩා ලෙස හඳුන්වයි.

(ii) <u>රංග අභ්‍යාස</u>
කටහඬ අභ්‍යාස / දර්පණ අභ්‍යාස / සුවතා අභ්‍යාස / ශිථිලකරණ අභ්‍යාස / තාපන අභ්‍යාස
<u>රංග ක්‍රීඩා</u>
මීමෝ මීමෝ / මකර වලිගය / ගමට රාක්ෂයෙක් ඇවිත් / බල්ලා සහ මස්කට්ට

(iii) සාමූහික බව, ජය පරාජය විඳ ගැනීම, ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව, සතුට, අභියෝගවලට මුහුණදීම, දරාගැනීම, ඉවසීම, ක්‍රියාශීලී බව ආදී කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05 (i) චාල්ස් ඩයස් - පණ්ඩුකාභය, නාගානන්ද, කුස ජාතකය, පද්මාවතී
ජෝන් ද සිල්වා - රාමායණය, සිරිසඟබෝ, දස්කොන්, දුටුගැමුණු, නලරාජ චරිතය

(ii) 1877 බොම්බායේ සිට පැමිණි පර්සි ජාතික බලිවාලා ප්‍රමුඛ එල්පින්සන් නාට්‍ය කණ්ඩායම නූර්ති ආරම්භ කළ බව විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(iii)
* පොසීනියම් රංගභූමිය භාවිතය
* කාන්තාවන් රංගනයට දායක වීම
* උත්තරභාරතීය සංගීතය භාවිතය
* ගෘහස්ථ ප්‍රේක්ෂකාගාරය භාවිතය
* චිත්‍ර වස්ත්‍ර භාවිතය
* කාලය කෙටි වීම
* දර්ශන , ජවනිකාවලට බෙදීම

(ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

06 (i) නෘත යනු - කිසිඳු අදහසක් ප්‍රකාශ නොවන හුදු රිද්මයානුකූල චලන පමණක් භාවිත රංගනයකි.
නෘත්‍ය යනු - අදහසක් ප්‍රකාශවන රිද්මයානුකූල අංග චලනයන්ය.

(ii)
* සජීවී බව
* කතා වස්තුවක් තිබීම
* සතර අභිනය භාවිතය
* සාමූහික කලාවක් වීම
* අනුශාංගික කලා භාවිතය
* ගබඩා කර තබාගත නොහැකි වීම
* ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර

(iii) නාට්‍ය හා කතාන්දරය අතර ඇති වෙසන විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

07 නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනගා චරිත, සංවාද හා රංග විධාන සහිත පිටපතක් නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.